නිපුණතාව- නාට්‍ය හා රංග කලාවේ විෂය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි
නිපුණතා මට්ටම 2.1- නාට්‍ය හා රංග කලාව යන්න විමසයි
සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. වාචික අභිනයට අයත් නොවන්නේ
   I. ගීත III. සංවාද
   II. ස්වගත IV. රංග වින්‍යාස

2. සාත්වික අභිනය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න
   I. චිත්ත ඒකාග්‍රතාවෙන් යුතුව සියුම් භාවයන් නිරූපණය කිරීම සාත්වික අභිනය වේ.
   II. සාත්වික අභිනයේ දී ප්‍රබලව ම මුහුණ භාවිතයට ගනී
   III. නාට්‍ය ශාස්ත්‍ර නම් වූ සංස්කෘත විචාර ග්‍රන්ථයෙහි සාත්වික භාව හතක් දක්වා ඇත.
   IV. සාත්වික අභිනය නිරූපණයේ දී නළුවා දැඩි චිත්ත ඒකාග්‍රතාවය කින් යුක්ත විය යුතුය
3. ආහාර්‍ය අභිනයට අයත් නොවන අංගය ඇතුළත් වරනය තෝරන්න

   I. වෙස් මෝස්තර, අංග රචනය, පසුතල නිර්මාණය, රංගාලෝකය
   II. රංගාලෝකය, සංගීතය, අංග රචනය, රංග වින්‍යාසය
   III. රංග වින්‍යාස, රංගාලෝකය, වෙස් මෝස්තර, අංග රචනය
   IV. අංග රචනය, රංග වින්‍යාස, පසුතල නිර්මාණය, නාට්‍ය පිටපත

4. නළුවා විසින් ස්වකීය ශරීරය උපයෝගී කර උපයෝගී කර නොගන්නා අභිනය වන්නේ
   I. සාත්වික අභිනය
   II. වාචික අභිනය
   III. ආහාර්ය අභිනය
   IV. ආංගික අභිනය

කෙටි පිළිතුරු සපයන්න

1. සංස්කෘත නාට්‍යයෙහි ආංගික අභිනයෙහි ප්‍රධාන ප්‍රභේද හතර දක්වන්න
2. නාට්‍ය ශාස්ත්‍ර නම් ග්‍රන්ථයෙහි සඳහන් සාත්වික භාවයන් ලියා දක්වන්න
3. නාට්‍ය උපකරණ යනු මොනවාද ?
4. අංග රචනය තුළින් චරිතයක නිරූපනය කර හැකි තත්ත්වයන් තුනක් ලියන්න
5. නාට්‍යයකට රංගාලෝක යොදා ගනු ලබන්නේ ඇයි?

රචනා ප්‍රශ්න

1. සතර අභිනය කුමක්ද යන්න හඳුන්වා, ඔබ මෑතකදී නැරඹූ නාට්‍යයක සතර අභිනය භාවිතා කර ඇති ආකාරය විස්තර කරන්න.
2. ඔබ නාට්‍යයක් නිර්මාණය කරන්නේ නම් ආහාර්ය අභිනය දායක කර ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද යන්න අනුපිළිවෙලින් පහදන්න
3. නාට්‍ය ධර්මී සහ ලෝක ධර්මී නාට්‍ය ද්විත්වයක් ගෙන, එහි සතර අභිනය භාවිතා කර ඇති අන්දම සංසන්දනය කරන්න